**ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම හා රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණය ද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1) (අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂ 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝම්බර් 31 දින ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් හා සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.8 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128 ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරී විසින් එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 128 (1) (ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින් වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත් ඒවා නිසි ආකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි ඒසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.2 |
| 128 (1) (අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/ හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ඌන උපයෝජනය<br>2. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම. | 2.3 (iii) |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේ දී පිළිපදිනු ලබන | අනුකූල නොවීම් | 2.6 |

| | | | |
|---|---|---|---|
| | බවට හා අවශ්‍ය අවස්ථාවල දී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | | |
| 128 (1) (ඌ) | රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම පිළිබඳ ප්‍රගතිය දැක්වෙන වාර්තා නිතිපතා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට යවන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීම සම්බන්ධයෙන් අනුමත උපරිම වියදම් සීමාව ඉක්මවා තිබීම | 2.4 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**2.1 කාර්යසාධනය**

**2.1.1 තිරසාර සංවර්ධනය**

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ තිරසාර සංවර්ධන අරමුණු ලෙස සැමට ජලය තිරසාර කළමනාකරණය හා සනීපාරක්ෂාව ලැබීම තහවුරු කිරීම හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත් මේ සම්බන්ධව දැනුවත් කිරීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ මහපෙන්වීම් හා වැඩමුළු කිසිවක් ආයතනය විසින් පවත්වා නොතිබූ අතර නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශයේ පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා පමණක් දෙපරේතමේන්තුවේ නිලධාරීන්ද සහභාගී වී තිබුණි.

**2.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් 2017 වර්ෂය සඳහා දෙපාර්තමේන්තු කාර්ය සාධන වාර්තාව 2018 අගෝස්තු 20 වන දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.2. වත්කම් කළමනාකරණය**

**(අ) වත්කම් ඌන උපයෝජන**

2017 දෙසැම්බර් මාසයේ ගබඩාවට ලැබී තිබුණු මුද්‍රණ යන්ත්‍ර 6 ක් හා බහු විධ මුද්‍රණ යන්ත්‍රයක් ඇසුරුම් සහිතව නිෂ්කාර්යව විගණන දිනය වන 2018 අගෝස්තු 29 වන විටත් ගබඩාවේ පැවතුණි.

**(ආ) නිෂ්ක්‍රිය බැංකු ගිණුම්**

අංක 1881/6 දරන හා 2014 සැප්තැම්බර් 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් ජාතික ප්‍රජා ජලභාරයේ කාර්යභාරය ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණි. ජාතික ප්‍රජා ජලභාරයේ 2014 දෙසැම්බර් 31 දිනට වූ ගිණුම් වාර්තා අනුව රු. 1,794,454 ක් වන ස්ථාවර තැන්පත් ගිණුමක් හා රු. 682,554 ක් වන ජංගම ගිණුමක් පවත්වාගෙන ගොස් තිබූ අතර එදින සිට මේ දක්වා දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමක් හෝ රජයේ ආදායමට බැර කිරීමකින් තොරව නිෂ්කාර්යය පවතින බව නිරීක්ෂණය විය. තවද විගණනය විසින් රැස්කරගත් තොරතුරු

අනුව 2017 දෙසැම්බර් 31 දිනට එම ස්ථාවර තැන්පත් ගිණුමේ හා ජංගම ගිණුමේ ශේෂය පිළිවෙලින් රු. 2,326,495 ක් හා රු. 837,323 ක් වන බව නිරීක්ෂණය විය.

**(ඇ) ව්‍යාපෘති සතු වාහන පරිහරණය කිරීම**

**-----------------------------------------**

සමාලෝචිත වර්ෂය තුළ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ලුනාව සංවර්ධන හා, ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය සහ ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය සතු වාහන 3 ක් පරිහරණය කර තිබුණි.

**2.3 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම.**

**------------------------------------------------------------------------------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 03 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 2015 | පුනරාවර්තන | 44.9 | 39.8 | 5.1 | 11.4 |
| | මූලධන | 200.0 | 109.5 | 90.5 | 45.3 |
| | **එකතුව** | **244.9** | **149.3** | **95.6** | **39.0** |
| 2016 | පුනරාවර්තන | 96.6 | 93.7 | 2.9 | 3.0 |
| | මූලධන | 122.2 | 89.7 | 32.5 | 26.6 |
| | **එකතුව** | **218.8** | **183.4** | **35.4** | **16.2** |
| 2017 | පුනරාවර්තන | 143.1 | 128.0 | 15.1 | 10.6 |
| | මූලධන | 104.3 | 103.1 | 1.2 | 1.2 |
| | **එකතුව** | **247.4** | **231.1** | **16.3** | **6.6** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**-----------------------------------------------**

දෙපාර්තමේන්තුවට අදාළ විෂයය අංක 33201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තත්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 4.00 | 3.88 | 1.80 | 2.66 | 8.00 | 4.99 |

**2.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 891 (1) ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය සියළුම නිලධාරීන්ගේ නම් ඇතුළත් ඇප ලේඛනයක් පවත්වාගෙන යායුතු වුවද එසේ පවත්වා නොතිබුණි.

**2.6 අනුකූල නොවීම**

**2.6.1 නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීම්**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.7 වගන්තිය ප්‍රකාරව සේවකයින්ට ලබාදුන් ණය මුදල ආපසු අය කර ගැනීම ආරම්භ කළ යුත්තේ ඊළඟ මාසයේ සිට වන අතර ණය මුදල ගෙවන ලද දිනයේ සිට නියමිත ප්‍රමාණයට මාස්පතා පොළී අය කර ගත යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි

**2.7 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 101 පමණ වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම ආසන්න වශයෙන් රු. 444,718 ක් වී තිබුණි.

**(ආ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2017 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩුවල ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| (i). | ජ්‍යෙෂ්ඨ මට්ටම | 28 | 09 | 19 | 68 |
| (ii). | තෘතියික මට්ටම | 340 | 137 | 203 | 60 |
| (iii). | ද්විතීයික මට්ටම | 41 | 28 | 13 | 32 |
| (iv). | ප්‍රාථමික මට්ටම | 70 | 53 | 17 | 24 |

| | | | | |
|---|---|---|---|---|
| | ------ | ------ | ----- | ---- |
| **එකතුව** | **479** | **227** | **252** | **53** |
| | === | === | === | == |

සෑම සේවක වර්ගයක් යටතේම අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු සංඛ්‍යාවේ ප්‍රතිශතය 20 ට වඩා වැඩි බව නිරීක්ෂණය විය. එය අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 53 ක ඉහල අගයක් ගෙන තිබුණි.

## 2.8 රජයේ නිලධාරීන් ඇප තැබීම

--------------------------------

දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ඇප තැබිය යුතු නිලධාරීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 880(1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.